# ලංකාව, ඉන්දියාව හා බටහිරයෝ

මෙරට දෙමළ ප්‍රශ්නය ජාත්‍යන්තරකරණය වූයේ ඊයේ පෙරේදා නො වෙයි. ඇතැමුනට අනුව නම් දෙමළ ප්‍රශ්නය ජාත්‍යන්තරකරණය වී හෙවී ඇත්තේ තවමත් දශක දෙකක් පමණ ය. එහෙත් ඒ එසේ නො වෙයි. මුළු මහත් ප්‍රශ්නය ම උපත ලැබුයේ ජාත්‍යන්තරයේ මැදිහත් වීමෙනි. ලන්දේසීන් දහහත්වැනි සියවසේ සිය දුම්කොළ වගාව සඳහා දකුණු ඉන්දියාවෙන් වෙල්ලාලයන් හෙවත් කෘෂිකාර්මික කම්කරුවන් නොගෙනෙන්නට, පසුව බ්‍රිතාන්‍යයන් පාරවල් තැනීම සහ වෙනත් කාර්යයන් සඳහා කම්කරුවන් නොගෙනෙන්නට, ඊටත් පසුව කෝපි හා තේ වගාව සඳහා කම්කරුවන් නොගෙන්වන්නට මෙරට දෙමළ ප්‍රශ්නයක් නො මැත. ලන්දේසීහු හා බ්‍රිතාන්‍යයෝ එසේ වරින් වර ගෙන ආ දෙමළ ජනයා පිළිවෙළින් යාපනයේ, මකලපුවේ හා නැගෙනහිර වෙරළේ, සහ කඳුකරයේ පදිංචි කළහ.

පසු කලෙක බ්‍රිතාන්‍යයෝ යාපනයේ වෙල්ලාලයන්ට සිංහලයන් ඉක්මවා යන බලතල, වරප්‍රසාද ආදිය දීමෙන් වෙල්ලාල ප්‍රභූන්ට තමන් යාපනයේ පමණක් නොව මුළු ලංකාවේ ම නායකයන් ය යන හැඟීම දුන්හ. වෙල්ලාල ප්‍රභූහු ව්‍යවස්ථාදායකයේ තම ජන අනුපාතයට, ඉතිහාසයට නොසරිලන බලතල ඉල්ලූහ. මධ්‍යයෙහි ඒ ලබාගත නොහැකි වූ කල වෙල්වනායගම් මහතාගෙන් පසුව ඔවුහු ඊනියා නිජභූමියක වෙනම රාජ්‍යයක් ඉල්ලූහ. ප්‍රභූන්ගේ මන්දගාමී උත්සාහය ප්‍රතික්ෂෙපකළ තරුණයෝ ඊනියා සිංහල රාජ්‍යයෙන් නිදහස ලබා වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට අවි අතට ගත්හ. වෙල්ලාලයන්ගේ බොරු ඉතිහාස කතා හා හැඟීම් අවුස්සන සුළු ආවේගී ක්‍රියා නොවන්නට ප්‍රභාකරන් බිහි නොවීමට තිබිණි. වැඩි විස්තර සඳහා ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනා ලා කියවන්න. (මේ පොත අද මුද්‍රණයෙහි නොමැති බව ද සඳහන් කළ යුතු ය. එහෙත් එය වැඩිකල් නොගොස් චින්තන පර්ෂදයෙහි කාලය වෙබ් අඩවියෙහි අඩවිගත කිරීමට බලාපොරොත්තු වෙමු.)

තරුණයෝ වෙල්ලාල නොවන කුලවලින් ද පැමිණියහ. වෙල්ලාල නොවන තරුණයන්ට සටන් දෙකක් විය. එකක් ඊනියා සිංහල රාජ්‍යයට විරුද්ධව ය. ඒ සටන එක් පැත්තකින් වෙල්ලාලයන් වෙනුවෙන් කරන ලද්දකි. ඒ හේතුවෙන් අද ද එතෙක් මෙතෙක් ඇති වූ වෙනස්කම් ගැන අවබෝධයක් නොමැති පිටරට විසිරුණු ඇතැම් වෙල්ලාලයෝ වෙල්ලාල නොවන තරුණයන්ට ආධාර කරති. එහෙත් වෙල්ලාල නොවන තරුණයන්ට තවත් සටනක් ද වෙයි. ඒ වෙල්ලාලයන්ට, කුල පීඩනයට හා හින්දු සංස්කෘතියට විරුද්ධ සටනකි. කුල පීඩනය යුක්ති යුක්ත කෙරෙන්නේ හින්දු ආගම හා සංස්කෘතිය ඔස්සේ ය. මේ සටන් දෙකම එකතු වී ඇත්තේ කරෙයිවර් කුලයේ ප්‍රභාකරන් ඔස්සේ ය. වෙල්ලාලයන්ට විරුද්ධ සටන හින්දු විරෝධී සටනක් ද වෙයි. ප්‍රභාකරන්ගේ ආගම කුමක් වුවත් ඔහු සංස්කෘතික වශයෙන් යුදෙව් ක්‍රිස්තියානි වෙයි. ඔහුගේ චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි වෙයි.

හැත්තෑවේ දශකයේ අවිගත් තරුණයන් කරළියට එනවිට මේ වෙනස්කම දැකගන්නට නො හැකිවිය. සියළු තරුණයෝ වෙල්ලාල නායකයන්ට අපේ කොල්ලෝ වූහ. ජේ ආර් ජයවර්ධන මහතාගේ බටහිර ගැති විදේශ ප්‍රතිපත්තිය ද හේතුවෙන් ඉන්දියාව මේ සියළු කොල්ලන්ට ආධාර කෙළේ ය. ඔවුන්ට අවි පුහුණුව ලබා දුන්නේ ය. ඉන්දියාවට තිබුණේ ජයවර්ධන විරෝධයක් පමණක් නො වේ. ඔවුන්ට එදත් එදත් ලංකාව තම අණසක යටතේ තබාගැනීමේ වුවමනාව වෙයි. අවිගත් දෙමළ තරුණයන් තමන්ගේ ඉත්තන් කර ගැනීමට ඉන්දියාව කල්පනා කෙළේ ය. (ඇතැම් දේශපාලන පක්ෂවලින් මෙහෙයවෙන සංවිධාන මෙන් නොව ඉන්දියාව සම්බන්ධයෙන් අපේ ආකල්ප වෙනස් වී නැත. බටහිරයන්ට විරුද්ධව ක්‍රියාකරන්න යැයි යදිමින් අපි ඉන්දීය තානාපති හමුවීමට නො ගියෙමු.)

එහෙත් ප්‍රභාකරන් වැඩිකල් නොගොස් තම වෙල්ලාල මස්සිනාලා ඝාතනය කිරීමට පටන්ගත්තේ ය. සටනෙහි ත්‍රස්තවාදී විධික්‍රම වැඩි වැඩියෙන් භාවිතා විය. ප්‍රභාකරන් ඉන්දියාවේ දී ම ප්ලොට් සංවිධානයේ මහේෂ්වරන් ඝාතනය කෙළේ ය. ඊනියා සිංහල රාජ්‍ය විරෝධී සටන හින්දු විරෝධී සටනක් බවට ද ක්‍රමයෙන් පත්විණි. ඒ සමග බටහිරයෝ ද කතෝලික හා ක්‍රිස්තියානි නායක පූජකයෝ ද බටහිරින් කුලී ලබන රාජ්‍ය නොවන පිරිස් ද ජඩමාධ්‍යවේදීහු ද කතෝලික චින්තනයෙන් ජනිතවූ මාක්ස්වාදය අනුකරණය කළ ඇංකරයෝ ද ආදී එකී නොකී පිරිස් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය වෙනුවෙන් වඩාත් සංවිධානාත්මක ව පෙළගැසුණහ. එහෙත් රාජ්‍යය පවත්වාගෙන යෑමට ක්‍රියාකිරීමට ජේ ආර් ජයවර්ධන මහතාට සිදු විය.

© Prof. Nalin De Silva

වඩමාරච්චිය දෙමළ ජාතිවාදයේ එක් සන්ධිස්ථානයක් විය. ඒ සටනෙහි ජයග්‍රහණය ජයවර්ධන මහතාට හා ඇතුළත්මුදලි මහතාට ලබාදීම ඉන්දියාවේ අභිප්‍රාය නො වී ය. ඉන්දියාවට ආණ්ඩුව තුළ ද ඒජන්තයකු අවශ්‍ය විය. නායකත්වය සඳහා ඇතුළත්මුදලි මහතා සමග කවදත් තරග කළ ගාමිණී දිසානායක මහතා ඒ පුරප්පාඩුව පිරවී ය. වඩමාරච්චි සටන අත්හැරීමට ඇතුළත්මුදලි මහතාට සිදු වූ අතර පරිප්පු දේශපාලනය ඔස්සේ ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාත්මක වී ඊනියා සාම සාධක හමුදා ලංකාවට පැමිණියේ ය. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය නීතිය බවට පත්විය. පළාත් සභා පිහිටුවිණි. උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනතාවගේ ඊනියා සාම්ප්‍රදායික වාසභූමි ලෙස ඉන්දු ලංකා ගිවිසුමෙන් පිළිගැණුනු අතර හදිසි නීතිය හරහා ගැසට් නිවේදනයක් මගින් තාවකාලිකව යැයි කියමින් ඒ පළාත් දෙක සඳහා එකම පළාත්සභාවක් ඇතිකෙරිණි. ඉන්දියාව එක ගලින් (ගිවිසුමෙන්) කුරුල්ලන් කිහිප දෙනකු මරාගැනීමට උත්සාහ කෙළේ ය.

එක් පැත්තකින් වෙල්ලාල විරෝධී ප්‍රභාකරන් පරාජය කිරීමට ඉන්දියාවට අවශ්‍ය විය. අනෙක් පැත්තෙන් ජයවර්ධන හා ඇතුළත්මුදලි මහත්වරුන්ට ඒ ජයගහණය ලබාදීම ඉන්දියාවේ අපේක්ෂාව නො වි ය. ගාමිණී දිසානායක මහතා තම කොළඹ නියෝජිතයා කරගන්නා අතර වරධරාජ පෙරුමාල් තම තිරිකුණාමලයේ නියෝජිතයා කරගැනීමට ඉන්දියාව බලාපොරොත්තු විය. ලංකාවට ඇති බටහිර බලපෑම් හැකිනම් නැතිකර මෙරට ඉන්දියාවේ අණසක යටතේ තබාගැනීම ඉන්දියාවේ මූලික අවශ්‍යතාව විය.

එහෙත් ඉන්දියාව නොසැලකූ සාධකයක් විය. ඒ සිංහලත්වය ය. ඇතැම් විට ඉන්දියාව ඒ සුළුවෙන් තක්සේරු කළා විය හැකි ය. ඒ කෙසේ වෙතත් සිංහලත්වය වෙනුවෙන් අවිඥානික ව හෝ සටන් කරන ශ්‍රී ල නි පක්ෂය දෙමළ නිජභූමියකට මඟපෑදූ උතුරු හා නැගෙනහිර පළාත් එක්කළ ගිවිසුමට විරුද්ධ විය. ජ වි පෙ හා වෙනත් සංවිධාන ද ඒ විරෝධතා අරගලයට එක්විය. ඒ අරගලයෙහි ශක්තිය වූයේ ශ්‍රී ල නි ප අවිඥානික ව හෝ නායකත්වය දුන් සිංහලත්වය බව ජ වි පෙ අමතක නොකළ යුතු ය. රුසියන් ඔක්තෝබර් විප්ලවය ගැන විවිධ අය විවිධ මත ප්‍රකාශ කරති. එය ලෙනින් මාක්ස්වාදයට එරෙහිව එහෙත් මාක්ස්වාදයේ නාමයෙන් ගැටකැපීමකින් රාජ්‍ය බලය බලය ලබාගැනීමක් ලෙස ද විස්තර කළ හැකි ය. සත්තකින් ම ඒ ඉතිහාසයේ පෙරළිකාර ම ගැට කැපීම විය. ලෙනින් ඉතිහාසයේ දක්ෂතම ගැටකපන්නා විය. (සියළු වර්ගවල කසිකබල් මාක්ස්වාදීන්ගේ උදහසට මා පාත්‍රවන බව දැන දැනත් ඒ බව ප්‍රකාශ කළ යුතු ය) එහෙත් රාජ්‍ය බලය මාක්ස්වාදයේ නාමයෙන් හෝ ජාතියේ නාමයෙන් හෝ ගැට කැපීමෙන් ලබාගත හැකි අවස්ථා ඉතා විරල බව කාගෙ කාගෙත් දැනගැනීම සඳහා අවධාරණය කළ යුතු ය.

සිංහලත්වයේ නායකත්වය සාම්ප්‍රදායික ව ශ්‍රී ල නි පක්ෂයට හිමි වුව ද එහි අභ්‍යන්තර ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස ප්‍රේමදාස මහතා ජනාධිපති ධුරයට පත්විය. ඒ මහතා සිංහලත්වයේ සටන් පාඨය අතට ගත්තේ ය. ඉන්දියාවට සාම සාධක හමුදාව අකුළාගෙන යෑමට සිදු විය. ඊළාම් රාජ්‍යයක් ප්‍රකාශ කළ වරධරාජ පෙරුමාල්ට ඉන්දියාවේ ම ලැගුම් ගැනිමට සිදු විය. ජ වි පෙරමුණ ද මර්දනය කෙරිණි. ජ වි පෙ නොපිළිගත්ත ද එයට ශක්තියක් ලැබෙන්නේ ශ්‍රී ල නි පක්ෂය සමග සමීප ව කටයුතු කරන විට ය. ශ්‍රී ල නි පක්ෂයෙන් ඈතට යත් ම එහි ශක්තිය හීන වෙයි. ආයුධ ගත් බොහෝ පක්ෂ හා සංවිධානවලට ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී මාවත ගැනීමට සිදුවිය. අද ආයුධ ඇත්තේ කොටි සංවිධානයට, ඩග්ලස් දේවානන්ද මහතාගේ පක්ෂයට හා පිල්ලයාන්ගේ පක්ෂයට ය. දෙවනු කී පක්ෂ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී මාවතට පිවිස ඇති අතර ඔවුන් පවසන්නේ ආත්මාරක්ෂාව වෙනුවෙන් ආයුධ ගැනීමට බළ කෙරී ඇති බව ය. කොටි සංවිධානය පරාජය කළ දිනක ඔවුන් ආයුධ අත්හරිනු ඇතැයි කියැවෙයි.

ඉන්දියාව සාම සාධක හමුදා ආපසු හකුළා ගැනීමෙන් පසුව මෙරට බටහිර බලපෑම් ක්‍රමයෙන් වැඩිවන්නට පටන්ගත්තේ ය. මුල දී ඒ බව එතරම් දැනෙන්නට නො වී ය. කොටි සංවිධානයේ හින්දු විරෝධත්වය තව තවත් වැඩිවිය. ඊනියා සාම සාධක හමුදාවට හා ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධ වූ කොටි ඉන්දියාවට විරුද්ධ වීම අරුමයක් නො වෙයි. එහෙත් කොටි පිටුපස බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය එවකටත් පෙළ ගැසී තිබූ බව බොහෝ දෙනකු තේරුම් නොගත් කාරණයක් විය. ඉන් පසු දෙමළ ජාතිවාදයේ විකාශය අපි පසු දිනෙක සාකච්ඡා කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva